# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2331/20 - 2023 මැයි මස 09 වැනි අඟහරුවාදා - 2023.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: KDS/PDB/4/3/2/14.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/12/2018/ws/296.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය:*

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ දොරගමුව ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවට මහනුවර ජ්‍යෙෂ්ඨ මිනින්දොරු අධිකාරි විසින් මැන පිළියෙළ කරන ලද අංක ක.සි. 321065 දරන පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1586 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

**කැබලි අංකය 01**
ඉඩමේ නම: විහාරවත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1586.
උතුරට: දොරගමුව (කොටසක්)
නැගෙනහිරට: දොරගමුව (කොටසක්)
දකුණට: දොරගමුව (කොටසක්)
බටහිරට: දොරගමුව (කොටසක්)

හිමිකම් කියන්නාගේ නම් සහ ලිපිනයන්: රජය

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 ජූලි මස 10 වැනි දින පෙ. ව. 10.00 ට පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී, මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2023 ජූනි මස 31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. හිමිකම්කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

**ඩබ්. එම්. ටී. ඩී. කේ. වීරකෝන්,**
ප්‍රාදේශීය ලේකම්
පාතදුම්බර.

2023 අප්‍රේල් මස 28 වැනි දින,
පාතදුම්බර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

EOG 05 - 0050

1A - G 039446 – 19 (2023/05)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ යොමු අංකය: HAK/LAN/1/4(vi).

1964 අංක 28 දරන අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ 2023 මාර්තු මස 03 වැනි දින අංක 2321/71 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* III වන කොටසේ පළකරන ලද මගේ යොමු අංක HAK/LAN/1/4(vi) සහ 2023 අප්‍රේල් මස 26 වැනි දින දරන දැන්වීමේ සඳහන් පරීක්ෂණ දිනය සහ වේලාවද, වන්දි ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළයුතු දිනයද පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

9 වන වගන්තිය හිමිකම් පරීක්ෂණ දිනය හා වේලාව - 2023.05.31 දින පෙරවරු 10.00

වන්දි ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළයුතු දිනය - 2023.05.22 දින පෙරවරු 10.00

**බී. එස්. රන්ජිත,**
ප්‍රාදේශීය ලේකම්,
හක්මණ.

2023 අප්‍රේල් මස 28 වැනි දින,
හක්මණ, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

EOG 05 - 0051

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.